RARE

# යථාර්ථවාදී රීතිය හා ලාංකීය සිනමාව

(තෝරාගත් චිත්‍රපට 10කට විශේෂිතව තුලනාත්මක සන්නිවේදන අධ්‍යයනයක්)

ශිෂ්‍ය අංකය : FGS/M/MSSc/2007/14

සමාජීය විද්‍යාපති ජනසන්නිවේදනය උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1270 |
| වර්ග අංකය: | |



මාර්තු 2015

## සංක්ෂේපය

මාතෘකාව : යථාර්ථවාදී රීතිය හා ලාංකීය සිනමාව (තෝරාගත් චිත්‍රපට 10කට විශේෂිතව තුලනාත්මක සන්නිවේදන අධ්‍යයනයක්)

නම : එච්.එම්.අයි.යූ.ආර්.බී. හේරත්

විභාග අංකය : FGS/M/MSSc/2007/14

1901 වසරේ දී දියතලාවේදී බෝයර් ජාතික සිරකරුවන් පිරිසකට තනි රීලයේ චිත්‍රපට පෙන්වා ආරම්භ කළ සිනමාව මේ වනවිට වසර 115 ක් පමණ ගෙවා දමා ඇත. ලාංකීය සිනමාව ආරම්භ වන්නේ ලෝක සිනමාව ආරම්භ වී වසර 05 කට පසුවය. ආරම්භයේදී දකුණු ඉන්දීය සිනමාවේ ග්‍රහණයට හසුවන ලාංකීය සිනමාව මුළුමනින්ම කොපි සිනමාවක් බවට පත් විය. එමෙන්ම ඒකාකාරී කථාවස්තුවලින් සමන්විත විය. දේශීය සිනමාව බිහි වන්නේ ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා 1956 වසරේදී "රේඛාව" චිත්‍රපටය අධ්‍යක්ෂණය කිරීමත් සමගය. එහෙත් යථාර්ථවාදී සිනමාවේ ආරම්භය ලෙස සැලකෙන්නේ 1963 වසරේ දී "ගම්පෙරළිය" චිත්‍රපටය බිහි වීමත් සමගය. එය ද ලෙස්ටර්ගේම අධ්‍යක්ෂණයක් විය.

මෙම පර්යේෂණයේ අරමුණ බවට පත් වූයේ ලාංකීය සිනමාවේ යථාර්ථවාදී රීතිය අධ්‍යයනයයි. එමෙන්ම ඒ හා බැඳුණු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික පසුබිම විමර්ශනය ද අරමුණු අතර විය. අපගේ පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ ලාංකීය සිනමාව තුළ යථාර්ථවාදය නිරූපණය වන චිත්‍රපට හඳුනාගත හැකි ද යන්නයි. මෙහිදී අප ගොඩ නගා ගත් උපන්‍යාස බවට පත් වූයේ ලාංකීය සිනමාව තුළ යථාර්ථවාදය ගුරුකොටගත් සිනමා කෘති හමු වේ යන්නයි. සාහිත්‍ය අධ්‍යයනය මත පදනම්ව නියැදිය තොරා ගැනීම සිදු කෙරිණ. ඒ අනුව පර්යේෂණ සීමාව තීරණය කෙරිණ. මෙහිදි තෝරාගත් චිත්‍රපට 10 කට විශේෂිතව පර්යේෂණය සිදු කෙරිණ. ප්‍රධානතම පර්යේෂණ ක්‍රමවේදය බවට පත් වූයේ අන්තර්ගත විශ්ලේෂණයයි. අංශ කිහිපයක් ඔස්සේ කෘති විශ්ලේෂණය කෙරිණ. එකිනෙකට වෙනස් අනුභූතීන් පාදක කරගත් මෙම සිනමා කෘති පර්යේෂණයට බඳුන් කිරීමේදී උපන්‍යාසය සනාථ වීම සිදු විය.

පර්යේෂණය තුළින් එළඹුණු නිගමන බවට පත් වූයේ යථාර්ථවාදී සිනමාවේ ආරම්භයේ සිට මේ දක්වා යථාර්ථවාදී රීතිය ගුරුකොට ගත් සිනමා කෘති හමුවන්නේ අතළොස්සක් බවය. සිනමාවේ කර්මාන්තමය ස්වරූපය නිසාදෝ වාණිජ සිනමාව ද ප්‍රබල ලෙස වර්ධනය වී තිබේ. ඇතැම් ඒවා සරළ හාස්‍ය රැගත් ඒවාය. එමෙන්ම ජාතිවාදී අරගල, දේශපාලනික අර්බුද නිසාද ලාංකේය සිනමාව ගතිකයන්ට ලක් විය. එමෙන්ම මෙම පර්යේෂණයේදී මතුකර ගත් ප්‍රබල කරුණක් වූයේ යථාර්ථය යන්න කලින් කලට විවිධ මුහුණුවර ගන්නා බවය. මෙම පර්යේෂණය තුළින් එළැඹුණු නිගමනයන්ට අනුව කිව හැක්කේ මෙරට සිනමා අධ්‍යාපනය විධිමත් හා ගුණාත්මක එකක් බවට පත් විය යුතු බවය. සිනමාව කර්මාන්තයක් ලෙස වර්ධනය කිරිම සඳහා කර්මාන්තයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය ද රාජ්‍ය මට්ටමින් ප්‍රතිපත්ති හා තීරණ ද ක්‍රියාත්මක විය යුතු බව සඳහන් කළ යුතුය.

මූල පද - සිනමාව, යථාර්ථවාදය, කලා න්‍යාය, රූප රචනය, සිනමාරූපීත්වය,

# ABSTRACT

**Topic** - Realism and Sri Lankan cinema (A balanced study focusing on 10 selected films)

**Name** - H.M.I.U.R.B. HERATH

**Index no** - FGS/M/MSSc/2007/14

Sri Lankan cinema counts 115 years since when it first started by screening one-reeler films to a group of Boyer national prisoners in Diyathalawa in 1901. Sri Lankan cinema was born after 5 years of the inception of world cinema. Being heavily influenced by the South Indian cinema from the very beginning the Lankan cinema became entirely imitative. Furthermore, the plots were stereotypical. "Rekhawa" directed by Lester James Peries in 1956 was the breakthrough creation that led to the emergence of local cinema. However "Gamperaliya", also directed by Lester James Peries in 1963 is considered the beginning of realistic cinema.

The main objective of this research was to study the realistic style of the Sri Lankan cinema. Exploring the socio-economic, political and cultural issues woven around it was another aim. The research problem was whether the creations in the Sri Lankan cinema that reflect realism can be clearly identified. The hypothesis was creations grounded on realism can be found in the Sri Lankan cinema. The sample was selected based on the literature review. The research scope was determined on that. The research was carried out focusing on 10 selected films. The main research methodology was content analysis. The creations were analyzed on several categories. When the analysis was carried out on films with different plots the hypothesis was proven.

However, the conclusion was that we find only a handful of cinematic creations that are based on realistic style since the emergence of it. Furthermore, owing to the industrial aspect the commercial films sector has grown considerably. Some are comedies. However, the Lankan cinema has undergone many changes due to ethnic tensions and political crisis. Furthermore, this research has also observed that realism has different faces from time to time. The research finally concludes that the local cinema education should be more qualitative. Policies and decisions should be made at state level to develop the cinema as an industry.

**Keywords** - Cinema, Realism, Theories of Art, Visualization, Cinematography